මගේ අංකය
எனது இல.
My No. } P.N/media/P.R

ඔබේ අංකය
உமது இல.
Your No. } ......................

දිනය
திகதி
Date } .....2015.05..07

.......................................

.......................................

.......................................

## මාධ්‍ය නිවේදනයයි.

වසර 1978/06/14 දින නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ අංක 121 මඟින් රාජ්‍ය සේවයේ විශ්‍රාම ලබන නිලධාරින්ට විශ්‍රාම ලබන දිනයේදී ම විශ්‍රාම වැටුප් පාරිතෝෂික මුදල ලබා දීම, එළැඹෙන මාසයේ ම මාසික විශ්‍රාම වැටුප ලබා දීමත් සඳහා අවශ්‍ය උපදෙස් හා නියෝග ලබා දී ඇතත් පසුගිය වකවානුව තුළ එකී කාර්යය සිදු වූ බවක් දක්නට නොලැබුණි.එබැවින් එකී නියෝග වර්තමානයට ගැලපෙන පරිදි භාවිතා කර මාසික විශ්‍රාම වැටුප හා විශ්‍රාම පාරිතෝෂික මුදල කඩිනමින් ගෙවීම සඳහා 3/2015චක්‍ර ලේඛය 2015/04/24 දින විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇත.

එහිදි පහත කරුණු පිළිබඳ විශේෂ සැලකිල්ලක් දක්වා ඇත.

01. රාජ්‍ය සේවකයා සේවය කරන කාර්යාල මඟින් පෞද්ගලික ලිපි ගොනුව නිසි පරිදි යාවත්කාලීන කිරීම .එහිදි විශ්‍රාම වැටුප් සැකසීම සඳහා අත්‍යවශ්‍ය වන පත්වීම් ලිපිය උප්පැන්න සහතිකයේ මුල් පිටපත ,සේවය ස්ථිර කිරීමේ ලිපිය, කාර්යක්ෂමතා කඩයිම් විභාග සමත් වූ ලිපි ,උසස්වීම් හා සේවයේ සිදුවන වෙනස්කම්වලට අදාල ලිපි හා විනය නියෝග ලිපි, චර්යා සටහන් ආදිය නිවැරදිව යාවත්කාලීන කරමින් පෞද්ගලික ලිපි ගොනුවට ඇතුලත් කළ යුතුය.
එමෙන් ම දැනට වැන්දඹු අනත්දරු ගොනුවට අදාලව යොමු කළයුතු සියලු ලේඛනයන් ද පෞද්ගලික ලිපි ගොනුවට ඇතුළත් කළ යුතු ය.

02. විශ්‍රාම ලැබීමට මාස 06 ට පෙර අදාළ නිලධාරියා විශ්‍රාම ගැන්වීම සඳහා පත්වීම් බලධාරියා වෙතින් අනුමත කරවා ගත යුතු අතර විශ්‍රාම ලැබීමට මාස 03 ට පෙර අදාළ ආයතනය මඟින් විශ්‍රාම වැටුප් දෙපාර්තමේනතුව වෙත යොමු කළ යුතුය. එමෙන්ම 2015/05/01 දින සිට විශ්‍රාම යන නිලධාරීන් වෙනුවෙන් දැනට භාවිතා කෙරෙන "අ"ආකෘති පත්‍රය වෙනුවට PD 3 නමින් නව

ආකෘති පත්‍රයක් හඳුන්වා දී ඇත.(මෙසේ වෙනස් කරන ලද සියලු ආකෘති පත්‍ර 3/2015 චක්‍රලේඛයට අදාළ ඇමුණුම් ලෙස යොදා ඇත.)

එමෙන් ම එහිදී යොමු කළ යුතු ලේඛන ආදිය පිළිබඳ අදාල නිලධාරින් මේවන විටත් දැනුමවත් කර ඇත.

03. මෙකී නව ක්‍රමය අනුව නිකුත් කරන ලද විශ්‍රාම වැටුප් අංක www.pensions.gov.lk වෙබ් අඩවිය මඟින් ලබා ගත හැකි අතර විශ්‍රාම වැටුප් අංකය නිකුත් කළ පසු විශ්‍රාම ලැබූ මාසයේ සිට ම මාසික විශ්‍රාම වැටුප් අදාළ විශ්‍රාමිකයාගේ බැංකු ගිණුම වෙත ඍජුවම ප්‍රේෂණය වනු ඇත.

04. සෑම වසරකම මැයි මස පළමු සතිය මානව සම්පත් සතිය ලෙස විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව යෝජනා කරන අතර ඒ කාලය තුළ නිලධාරින්ට සිය පෞද්ගලික ලිපි ගොනු පරික්ෂා කිරීමට හා යාවත්කාලීන කිරීමට ඉඩ ලබා දීම ආදිය යෝජනා කෙරේ .

05.

06. මේ කටයුතු සඳහා එක් එක් ආයතනයන්හි අනුයුක්තව කටයුතු කරන නිලධාරින්ගේ ගණන අනුව විශ්‍රාම වැටුප් අංශ පිහිටුවීමට ද විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව යොජනා කෙරේ.තවද විශ්‍රාමික ප්‍රජාව වෙත නවීන ඉලෙක්ට්‍රොනික හැඳුනුම්පතක් ලබා දීම ද මේ යටතේ සිදු වේ.

මෙහිදී විශේෂයෙන් රාජ්‍ය සේවකයා විශ්‍රාම ලබන දිනට විශ්‍රාම වැටුප් පාරිතෝෂික මුදල ලබා දිමත් ඉන් එළැඹෙන මාසයේ සිට ම මාසික විශ්‍රාම වැටුප ලබාදීමත් දායකයා මිය යාමෙන් පසු කලත්‍රයන් වෙත එම මාසයේ සිට ම වැන්දඹු හා වැන්දඹු පුරුෂ වැටුප් ගෙවීමත් සිදු කළ හැකි වේ.

ඒ අනුව කිසිදු ප්‍රමාදයකින් තොරව විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා ඉදිරියේදී සියලු රාජ්‍ය සේවකයන් හට අවස්ථාව උදා වන අතර අදාළ රාජ්‍ය ආයතනයන්ට මෙන්ම පෞද්ගලිකව රාජ්‍ය සේවකයන්ට ද තමන්ගේ පෞද්ගලික ලිපි ගොනු යාවත්කාලීන කිරිම ආදී අදාළ ඉහත කටයුතු කෙරෙහි යොමු විමේ වගකීමක් ඇති බව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව දන්වා සිටී. තවද මෙකී 3/2015 නව චක්‍රලේඛය පිළිබඳව සියලුම රාජ්‍ය ආයතන ප්‍රධානීන් අවධානය යොමු කළ යුතු බව ද දන්වා සිටිමි.

එස්.එස්.හෙට්ටිආරච්චි.
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්.